PMoE Sabaragamuwa

සබරගමුව පළාත් සභාව - சப்ரகமுவ மாகாண சபை - Sabaragamuwa Provincial Council

අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

கல்வி தகவல் தொழில் நுட்பம் மற்றும் கலாச்சார நடவடிக்கைகளுக்கான அமைச்சு

**Ministry of Education, Information Technology & Cultural Affairs**

**Email – edusabaram@gmail.com** **www.moe.sg.gov.lk**

මගේ අංකය / எனது இல / My Number } ME/E/11/08/02/01-2025

ඔබේ අංකය / உமது இல / Your Number }

දිනය / திகதி / Date } 2025/11/12

අමාත්‍යාංශ ලේකම් / Secretary } **Office – 045 2223015**

කාර්යාලය / Office } **නවනගරය,රත්නපුර. / Newtown, Rathnapura. / Office - 045 2222542 Fax - 045 2228042**

---

පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ,

සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,

කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් හා

විදුහල්පතිවරුන් වෙත,

**<u>සබරගමුව පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ වන සියලුම ආයතනවල අනධ්‍යයන කාර්ය මණ්ඩලවල වාර්ෂික ස්ථාන මාරු - 2025/2026.</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් මාගේ සමාංක හා 2025.06.26 දිනැති ලිපියෙන් කැඳවන ලද වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත් සම්බන්ධයෙන් සලකා බැලීමෙන් පසු අනධ්‍යයන කාර්ය මණ්ඩල ස්ථාන මාරු මණ්ඩලයේ නිර්දේශ සලකා බලා 2026.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි පාසල් කාර්ය සහායක හා පාසල් මුරකරු තනතුරුවල සේවය කරන සේවකයින් සඳහා ලබා දී ඇති ස්ථාන මාරු නියෝග ඇමුණුම් 01හි සඳහන් කර ඇත. මෙම ස්ථාන මාරු නියෝග ඔබ පාසල/ ආයතනය/ දෙපාර්තමේන්තුව යටතේ සිටින සියලු අනධ්‍යයන (ප්‍රාථමික ශිල්පීය නොවන) සේවකයින්ගේ අවධානය යොමු කරවන ලෙස මින් දන්වා සිටිමි.

02. මෙම ස්ථාන මාරුවීම සබරගමුව පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ වන විදුහල් හා පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට අයත් සියලුම ආයතනවල අනධ්‍යයන කාර්ය මණ්ඩලවල වාර්ෂික ස්ථාන මාරු පටිපාටිය අනුව සේවක මහත්ම මහත්මීන්ගේ ඉල්ලීම් හා සේවා අවශ්‍යතාව සලකා බලා තීරණය කර ඇත. එම ස්ථාන මාරු නියෝග අනුව ස්ථාන මාරු කර ඇති ඔබ පාසලේ/ ආයතනයේ/ දෙපාර්තමේන්තුවේ සේවය කරන පාසල් කාර්ය සහායක, පාසල් මුරකරු සේවකයින් 2025.12.31 දිනට මුදා හැරීමට අවශ්‍ය කටයුතු කරන ලෙස කාරුණිකව මින් දන්වා සිටිමි. ඒ අනුව අනුප්‍රාප්තිකයින් සේවයට වාර්තා කරන තෙක් නොසිට මෙම ස්ථාන මාරු ලාභීන්ට 2026.01.01 දිනට තම නව සේවා ස්ථානයේ සේවයට වාර්තා කිරීමට හැකිවන පරිදි වර්තමාන සේවා ස්ථානයෙන් මුදා හැරීමට කටයුතු කරන ලෙසත්, **නියමිත දිනට සේවයෙන් නිදහස් නොකිරීමෙන් ඇති වන ගැටලු සම්බන්ධයෙන් එම ආයතන ප්‍රධානීන් වගකීමට** බැඳෙන බවත් වැඩිදුරටත් දන්වා සිටිමි. එබැවින් මෙම ස්ථාන මාරුවීම් වඩාත් ඵලදායීව හා කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම සඳහා ඔබගේ පූර්ණ සහයෝගය අපේක්ෂා කරමි.

03. ස්ථාන මාරු වී යාමට ප්‍රථම ඔවුන්ගේ භාරයේ ඇති රජයට අයත් දේපල, ලියවිලි, මිල මුදල් හෝ වෙනයම් දෙයක් වේ නම් ඒවා නම් කරනු ලබන අයෙකුට විධිමත් පරිදි භාර දීමට කටයුතු සැලැස්විය යුතුය.

04. 2025(2026) වාර්ෂික ස්ථාන මාරුවීම් සම්බන්ධයෙන් පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් වෙත අභියාචනා ඉදිරිපත් කළ හැකිය. ඒ සඳහා අමාත්‍යාංශ නිල වෙබ් අඩවියේ පල කර ඇති (ඇමුණුම් 02) ස්ථාන මාරු පටිපාටියේ **02 පරිශිෂ්ඨය** සම්පූර්ණ කර 2025.11.30 දිනට පෙර ආයතන ප්‍රධානියාගේ නිර්දේශයද සහිතව අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් වෙත යොමු කරන ලෙස කරුණිකව දන්වා සිටිමි.

බී.ඒ.සී.පී. බමුණුආරච්චි,
ලේකම්,
අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ හා
සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය.